
ශ්‍රී
හේමමාලා
නුවිනි හෙසාරා බටුකුමාර

# ශ්‍රී හේමමාලා

නුවිනි හෙසාරා බටුකුමාර

බ/ බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය
12 ශ්‍රේණිය T

ISBN 9786249384828

**කතෘගේ වෙනත් කෘති**

- *සංකල්පනා - පද්‍ය සංග්‍රහය 2025*
- *සංකල්පනා - පද්‍ය සංග්‍රහය 2025 (E-book)*
- *සංධිවනි - කෙටිකතා සංග්‍රහය 2025 (E-book)*

# පිදුම

සකලවිධ ස්ත්‍රී රත්නයන්ගේ
පහන් සංවේගය උදෙසා...



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමෙ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පූර්විකාව

දේව සේනා පුන් මදාරා දොහොත් ගෙනවිත්
මාර සේනා දණ නමා යක්ලොවින් වදිමින්
විහඟ සේනා සතුන් හා චිත් සියපත් ද පුදමින්
සඟ සෙනඟ වැඩි මග දිගේ එයි සාදු කියමින්

සන්තනක විකසිත ශ්‍රද්ධා පංකජ
මගින්මග සතරත සුවද අතුරන
ගුණබලෙන පිළිබිඹු වන්නෙ දම්ගුණ
සඟුන් වඩිනා උතුම් පිංබිම

තිලෝනායක පාද පහසේ සරණ යති
ලෝකනායක අමා දහමේ සරණ යති
ධර්මනායක උතුම් සඟ ගණ සරණ යති
මෙතුන් සරණෝ සීල රක්නා පිරිස එති

සාධු සාධූ දොහොත් නළලේ තබාලා
සාධු සාධූ රැගත් මල් බිම අතුරනා
සාධු සාධූ රැසක් දන දන් පුදන්නා
සාධු සාධූ දෙනෙත් ශ්‍රද්ධා පිරෙන්නා



වැඩි සඟුන් පෙරටුව උතුම් රහතුන්

වැඩි මඟුල් මඩුවට රජුන් සිටහුන්
වැඩි සෘද්ධි බලදුටු රජුන් එහි හුන්
වැඩි රහත් රුව දැක දෑස් විස්මදුන්

දකින ඒ රුව නිසල නිශ්චල
ගෙනෙන දොහොතම නලල් තලයට
රජුය වැන්දේ දෙවර නොසිතම
වදින දේවිගෙ බස රසට සිත ඇද

මිහිරි පිය වදන් මුමුනන්නී
රූ හැඬින් දෙස අග්‍ර වන්නී
බුදු දහම් රස සිත සනසවන්නී
ඈ දේවි කලිඟු රට රජුන් භාරී

"උතුමාණෙනි ලොවවෙත පතළ කිතුගොස
එයම වේ ගෞතම බුද්ධ නාමය
එනම් සසුනේ වඩින රහත් උතුමෙක් ය
මේ වඩින්නේ අප දෙසට කරුණා ඇසින් බලමින් ... "

කහ වනින් බැබලෙන උතුම් සඟගණ
රන් වනින් බැබලෙන උතුම් ගුණකඳ
රොන්වනින් බැබලෙන මලක් මත
ගෙනෙයි අලෝකයක් දෑතින

මාළිගයට වැඩියා වූ ඛේම මහ රහතන්වහන්සේ මෙසේ දෙසූ සේක.

"රජුනි ඛේම රහතුන් මම ය
රජුනි මේ වම් දන්ත දාතුව ය
රජුනි මෙය අප බුදු හිමිගෙම ය
රජුනි කළිගු රටට අද පටන් භාරයි මෙය "

දැනුනි මහගු දහමක බලේ
රශ්මි විහිදන දන්ත දාතුවේ
ගැනුනි භාරෙට රජුන් නොසිතාම දෙවරේ
පැමිණි රහතුන් ඒ දැක මෙසේ කීවේ

රජතුමනි නුඹ වේ බුදු දහම රක්නා කසිපත
යුධ ගැහැට හමුවේ යන්නටම වේ මේ මග
භාරකරුනම් නාගයෙකු රක්නා සේ මණිකය
පරපුරින් පරපුරට රැකගනු පිණිස
හොබවන්න නුඹෙ කගපත

නර නිරිඳු එහි දැහැමි රජයකට ආලෝක දෙන
වර පැවසි ඒ රහත් මුනිදුන් රජ දෑත මත
මර සෙන්ද පරදා දහම් ස්පර්ශය ලැබුව මිණ
සර ණ ගිය දෙස බුද්ධාලෝක විහිදා එ ද්වීපය

බ්‍රහ්ම මග ගිය ඇතැම් පිරිවර
එතියි කිය කිය මේ දහම් දොස
රජුය පෙරටුව අදහන්න කීවේ
ඒ දොසෙහි දොස මකා දමමින

බ්‍රහ්මදත්ත රජ දවසේ සිට
රැක ගෙන ධාතුව මහත් හරසරින
තුන් පරපුරක් ගෙවී ගිය යුගයෙන
ඒ රජ මුනුබුරු රජ වූවේ සිරිතට

ගුහසිව රජ දා පෙරදින නුවු ලෙස
නිගන්ඨයෙක් විත් ධාතුව පැහැරව
විනාස කරනට ප්‍රයත්න යොදමින
එහෙත් එහෙව් සතුරන් මැඩසිට
ධාතුන් වහන්සේ රැක්කේ ගුහ සිව

යලිත් වතාවක් යුධවිත් බීරදර
රකුස් වෙසින් ආ රජෙකිය නර
එහෙත් වෙහෙසවා ගුහසිව කසිපත
රක්නට ප්‍රයත්න දැරුවේ අවියෙන

ආයුෂ මෙතෙකැයි දැනුන නිරිදුන්ට
ගුහසිව රජු හෙලුවේ අවසන සුසුමද
පියාණනුත් නික්මීමෙන් මත්තට
ධාතුව භාර වුණි කුමරිය හේමමාලාට...

බුද්ධ වංශයේ කතා පුරාවතෙ
අභීත ගැහැනියකැයි පවසන
ඒ ස්ත්‍රී රත්නයෙ කතා වස්තුව
මෙසේ දිගහැරුමට...

හේමමාලාවන් දාතූන්වහන්සේ රැකගන්නට ගත්
වීර්යයේ මාර්ගයහි පියසටහන් මෙසේ ලියන්නට
බුද්ධ වර්ෂ දෙදහස් පන්සිය හැට නවයක් වූ මෙකී
වසරේ අපේ බසින් කියා යන්න අවසර!

# කතාංගය

"කුමරියනි කුමරියනී අන්න නෙලුම් මල් පිරිලා යමුද නෙලන්න ... "

"කෙසේ යන්නද හද්‍රා පෙනේද මහ සෙනඟ යළි පැමිණෙන අයුරු "

"කුමක් නමුත් සිදුවෙමින් පවතී කුමරිය "

"එසේය හද්‍රා"
හේමමාලා බිම බලාගත්තා ය. සදලුතලේ සිටින ඇගේ දෑස් විහිද තිබුණේ ඈත හිමව් පව්වෙන් එහා ඇති ඉමක් නොපෙනෙන ක්ෂිතිජය වෙතට ය. ඇගේ හඩ ද අද බිදී ගොස් තිබිණ. වෙනදාට මේ මාළිගා බිම කිකිණි හඬ නංවන මිණි මෙවුල් නාදෙ ඇගේ ය. හද්‍රා නැමති සේවිකාව ද ඈව ඇමතුවේ මලක් නෙලා ගොස් ධාතූන් වහන්සේ වන්දනා කරන අදහසින් ය. එහෙත් පියාණන් නොමැති සාංකාවෙන් හේමමාලා දුක්ව සිටින්නී ය. ඇගේ ගතත් සිතත් එක්ම තැනක නැවතී ඇත.

"අපි යමු මෑණියන් අසලට මට පියාණන් ගැන කුමක් හෝ පණිවිඩයක් දැන ගන්නට හැකිවේවි" එසේ හද්‍රාට පවසා හේමමාලා ඉක්මන් ගමනින් මාළිගයේ අනෙක් කෙලවරට ගමන් ගන්නට වීය.

ඈ ඇවිද යන විට දිගුවරල සුළඟට නැලවෙන්නේ පා කිකිණිය හඬ දෙන තාලයට මෙනි. පංච කල්‍යාණයක් තිබූ ඒ සුන්දර යුවතියගේ මුවත අද දුක්බර පෙනුමකින් ඉතිර තිබේ. ඒ බැව් තවත් පෙනෙන්නෙ ඇගේ ඇදි වත අද සුදු වතක් නිසා වෙනි.

අහස දිවා රස්නෙනුත් රක්ත වළාකුලිනුත් පිරී තිබේ. ගිගුම් දෙන්නට සූදානම් වූ කාල වළාවෝද එහෙ මෙහෙ වෙමින් හිමාලය දෙසින් ඇදී එයි. එහෙත් උණුසුම තවම අවසන් නැත. දහවල් අව්ව යුධ පිටියත් හෙම්බත් කරලා ඇති. කුමරියට සිතෙයි. හේමමාලා දිව එන අතරේ මව් බිසව සිටියේ මාළිගයෙන් එපිට පිහිටි දළදා මාළිගාවේය. ඇය එතනට වී ගාථාවක් මුමුණමින් යමක් යදිමින් සිටියා ය. එහෙත් හේමමාලා සිය හඬ නැංවූවා ය .

"මෑණියනී... "

"දියණිය නුඹ "

මව් බිසව පවසන්නට ගිය දේ පවසන්නට වූවේ නැත. හෙල්ලක්ද ඔසවාගනිමින් පැමිණි යුධවායෙක් මව් බිසව අසළ වැද වැටුණේ  ඇහිපිය ගසන පමාවටය . ඔහු මහා හඩින් හඩන්නට පටන් ගත්තේ ය.

"මේ කිමද ? කවරකට නුඹ හඬන්නේද? "

"අහෝ! බිසවුන් වහන්ස සමාවුව මැනව"

ඔහු හඬමින් බිඳුන හඬින් පවසන්නේ ය. මව් බිසව කලබලෙන් ඔහු දෙස බලන්නට විය. කුමරියද ඔහු දෙසට ළංව කිමැයි කියා ඇසුවා ය.

"නොහඬා වහා කිව, කිමද මේ?"

"අනේ... බිසවුන් වහන්ස... රජතුමා "

"කුමක්ද මා ස්වාමීන්ට වූවේ !"

"මහා රජෝත්තමයාණන් වහන්සේ... සතුරා අතින් මිය ගියා බිසවුන් වහන්ස සමාවන්න මා හට "

"මගෙ හිමියන් ! අහෝ මගේ හිමියන්!"

"මගේ පියාණන් ! අහෝ මෑණියනේ "

ඒත් සමඟම දළඳා මාලිගයින් ශෝකාලාපයක් ව නැඟි විලාපයක අදෝනාව බිසවගේත් කුමරියගේත් හැඬුම් ස්වරයේ ධ්වනිය මතුළේ ය. මේ බස් සැලවුණු වහ වහා ධාතු ගර්භය වෙත  දන්ත කුමරුන් පැමිණියේ

හතිලමිනි. ඔහුටත් පුවත දැනගත් ක්ෂණයේ පිරිමි හදවතින් සුසුම් ආව ද වගකීම් හා යුතුකම් සිහි ගැන්වීමෙන් සියල්ල අමතක කර දැමුවේ ය. දන්ත කුමරුගේ හිතේ කැකෑරුණේ ධාතූන්වහන්සේ රැකගන්නට ගත හැකි පිළියම කුමක්ද යන්නයි.

"බිසවුන් වහන්ස, නොහඬන්න බිසවුන් වහන්ස"

ඔහු මව් බිසවත් කුමරියත් සනසන්නට විය. ශෝකයෙන් පෙලෙමින් සිටි කුමරිය නැවතත් හැඬුම් ස්වරයක් පිට කළේ දන්ත කුමරු තමාට ළං වන විටය. සිය පෙම්වත් සහකරුවාණන් වූ දන්ත කුමරු නිවුණු පෙනුමින්ද හික්මුනු ගුණයෙන්ද ශ්‍රද්ධා සීලයෙන්ද බෞද්ධ සැදැහැවතින් ද යුක්ත වූ තරුණයෙකි. උදේනි රජුගේ පුත්‍රයාණන් වූ දන්ත කුමරුගේ සිත්ගත් තරුණ කුමරිය හේමමාලා කුමරි විය.  සිය ප්‍රියම්බිකාව දැන් සිය භාර්යාව වන්නී ය.

"බිසවුන් වහන්ස, දැන් කරන්නට ඇත්තේ මෙපමණයි"

"කිමෙක්ද පුතුනුවනේ ?"
මව් බිසව ඇසුවේ දන්ත කුමරුගෙනි.

"දන්ත ධාතූන් වහන්සේ අප රැකගත යුතුයි , බිසවුන්වහන්ස , දැනටමත් පර සතුරු සේනාව ළග

ළගම පැමිණෙනවා ඇති"

"නුඹ නිවැරදියි ශෝක වී පලක් නැහැ දියණියනේ වහා පැමිණෙන්න "

දෙනෙතෙහි වූ කඳුලැල් පිසලා ධාතුන් වහන්සේගේ කරඬුව වෙත ගමන් ගත් බිසව ඉන් ධාතුන් වහන්සේ පිටතට ගත්තා ය.

"මෙය කෙසේ හෝ නුඹලා දෙදෙනා ලංකා රාජ්‍යයේ රජුන් වෙත ගෙන යා යුතුයි "

"එසේය, එහෙත් මෙසේ ගෙන යෑම ආරක්ෂිත නොවේ. අප සඟවාගෙන යා යුතුයි"
දන්ත කුමරු විමසිලිමත් විය.

"මැනවි කුමරුනි දියණිය පැමිණෙන්න"

බිසව කුමරියගේ හිසේ කෙස් අතරින් ධාතුව සැඟවූවා ය. කුමරිය දොහොත් මුදුන් තියා වැදගෙන
"දළදා ස්වාමිනේ සමාවන සේක්වා ඔබවහන්සේගේ ආරක්ෂාව පිණිස මෙසේ රැගෙන යන්නට මට අවසරයි. ස්ත්‍රියක් පරිද්දෙන් මා මේ කරන්නේ වරද නම් එහෙත් මට සමාවන සේක්වා. සම්මා සම්බුදු තිලෝනායක මුනිදුන්ගේ දාතුන් වහන්සේ නමක් ආරක්ෂාවට මට

වීර්ය ලැබේවා"
යැයි ප්‍රාර්ථනා කළා ය. ඇගේ නීල වරලේ කෙහෙ රැලි අතරින් කෙසේවත් දාතුන් වහන්සේ සොයාගැනීමට අපහසුය. කිසිවෙකුත් මේ බව සැක කරන්නේද නැත.

හේමමාලා කුමරිය හා දන්ත කුමරුන් එසැනින් මාලිගයින් නික්මී ගොස් අසුපිට නැගුණාහ. කුමරිය ඉදිරියෙන් අසුන් ගන්වා පසුපසින් හිදගත් දන්ත කුමරා යුහුසුළුව සිය ගමන ආරම්භ කළේ ය. අසු ද නොදෙවෙනි වේගයකින් ඉදිරියට ගමන් ගත්තේ ය.

ආකාශ ගංගාව කාල වළා අතුරා ගෙන පිනි වැස්සක් ආරම්භ කර තිබුණි. තුරු සෙනඟද ඒ පින්නේ නැහැවෙමින් අනෝරාවකට සූදානම්ව සිටියහ. රනින් බැබලුන දළදා මාළිගයට ඒත් සමඟම කිසි යම්වූ පාලු බවක් එක්විය. මහ සේනාව දැන් රජෙක් නොමැත්තෙන් බිසවුන්ට දණ නැමූහ. කුඩා කුමරුවන්ලා එහි රජවන්නට ලා බාල වැඩිය.

මේ අතරතුර අස්ථාවර රාජ්‍යත්වයක් ඇති රාජ්‍යට වැදුණ, යුද්ධය ජයගත් සතුරු සේනාවේ සේනාධිපති දාතුන් තැන්පත් කර තිබූ මාළිඟයට ගොඩ විය. සිටින්නේ කවරෙක්ද කියා නොදන්නා නොසිතනා මොහු වියරුවෙන් මෙන් ධාතු කරඬුව විවර කර ධාතුන් වහන්සේ සෙවීය.

එහෙත් එතුළ ධාතුන් වහන්සේ නුවූයෙන් ඔහු සිය කඟපත ඔසවා බිසවුන්ගේ ගෙල ළඟ තැබුවේ ය.

"කොහෙද කියව ධාතූන් වහන්සේ "

"මම නොකියමි "
ඇය නිර්භයව කීවා ය.

"තිගෙ ගෙල සිදින්නට කලියෙන් කියව "

"මා මැරුවත් මම නොකියමි "
බිසව එහෙත් නොසැලීම සිටියා ය.

"මහ සෙනෙවි ,මහ සෙනෙවි අර මාවත දිගේ යුවලක් අසු පිටින් පළා යනවා "
සතුරු සෙනඟේ එක් සෙනෙවියෙක් දිවවිත් පුවත මහ සෙනෙවිගේ කනට කළේ ය.

"ලුහු බැදව , මම තී ගැන පසුව බලාගන්නම් "

සෙනෙවියාත් ඔහුගේ සියලු බලකායත් විදුලි වේගෙකින් කුමරු හා කුමරිය ගිය මඟට අවතීර්ණ වූහ. එහෙත් මේ බව කුමරු දුටුවේ මදකට පසුවය. මහා පර්වතයක් මස්තකයේ නැවතුනු කුමරුන් කුමරියද කැටුව ඒ පර්වතයේ ඉහළට නැංගේ ය. කුමරියට එය නුහුරු ය.

ඇගේ සිනිදු රතුපුල් දෙපතුල් සීරී ගියේ ය. ඒ වේදනාව නොසලකා කුමරිය සිතට වීර්යය ගත්තා ය. පර්වත මුදුනට වනවිට සීරුම් තුවල් වෙද්දී එහෙත් කුමරිය ඉවසා ගත්තීය. වේදනාවට එහස් ගිය ධාතුන්වහන්සේ රැකිය යුතු වගකීම ඇගේ සිතට ඇගේ අභ්‍යන්තරයින් මුමුණන්නී ය.

සතුරන් කිහිප දෙනෙක් ඒ වන විටත් ඔවුන් පසුපස පැමිණෙමින් සිටියහ. මද වේලාවක් පර්වත මුදුනේ සිටිනා විට සතුරන් කුමරියද කුමරුද කොටු කළහ. එහෙත් කුමරිය නිර්භයව සතුරන් පාමුල සිටගත්තා ය.එහෙත් ඔවුන් කොටු උනුමුත් ඔවුන්ට පසුපසින් තිබූයේ පර්වතයේ බෑවුමය . ඇය පසුපස හැරුණා ය. අහස පමණක් ඇයට දැකිය හැකි විය. බිම බැලූ කල නිල්වන් ජලය ඇති නෙලුම් ඕලු මල් ඉහිරුණු ගංගාවක් ය. කාරි නෑ දළදා වහන්සේ අප ආරක්ෂා කරාවි. කෙලෙසක හෝ අපේ දිවි රැකේවි. බුදු ගුණ සත්‍යයි. එසේ කල්පනා කර දෙවරක් නොසිතූ කුමරිය කුමරුන්ද ඇදගනිමින් පර්වතයෙන් පහත වූ දිය ගංගාවට පර්වත මුදුනින් පැන්නා ය.

දෙදෙනාම එකෙණෙහි මලය රජුගේ සේනාවෙන් බේරී දිය යට කිමිදුණාහ. එම ගැඹුරු ගංගාව තුළ අන්ධකාරය රජවී තිබිණි . එහෙත් ඒ අඳුර මැද්දේ නිල් දියේ කිමිදෙන හේමමාලාවන් හා දන්ත කුමරු දුටුවේ රන් මත්ස්‍යයෙකි.

රන් මත්ස්‍යයා ඔවුන් දෙසට පීනා ආවේ ය. මත්ස්‍යයා ඔවුන්දෙස බලා පසුපස හැරී යළි පිහිනන්නට ගත්තේ ඔහු පසුපස එන්නැයි පවසමිනි. කුමරාත් කුමරියත් පිහිනමින් රන් මත්ස්‍යයාගේ මග දිගේ ගිය විට ගුහාවක් හමුවිය. ඔවුන් ජලයින් මෙගොඩට පැමිණියහ.

"නමෝ බුද්ධාය! මා කුමරියනි අප දිවි බේරුණා"

"අහෝ ස්වාමිනී මේ නම් විශ්මයක් "

"එසේ ය කුමරියනි බලන්න ධාතූන් වහන්සේගේ ආශිර්වාදය අපව ආරක්ෂා කරනවා"

"සබඳ මත්ස්‍ය මිතුර නුඹට බෙහෙවින් කෘතවේදී වෙනවා යම් දිනක උදේනි පුර යුව රජුන් නුඹට මෙන්ම නුඹේ සමූහයාටම මීට කෘතගුණ සළකනවා . උතුම් දන්ත දාතූන් වහන්සෙව ආරක්ෂා කරන්නට උපකාර කිරීමෙන් නුඹ මහත් වූ පුණ්‍ය කර්මයක් කරගත්තා ... "

රන් මත්සයා ඔවුන බලා වතුරෙහි නොපෙනී ගියේ ය. කුමරුන් ඒ ජලයින් බිදක් පැන් කෙණ්ඩියට පිරෙව්වේ ය. කුමරිය සිය චිත්තේකාග්‍රතාව පවත්වා වීර්ය වැඩුවා ය.

"අප කෙසේ හෝ සතුරන් මැඩ මෙතරම් දුරක් පැමිණියෙමු. කෙසේ හෝ දළඳා දාතූන්වහන්සේ රැක

ගත්තෙමු. ඒ පුණ්‍යකර්මය සත්‍යයි. සත්‍යයි. සත්‍යයි . මේ සත්‍යානුභාව බලෙන් ඉදිරියේදී වන සියලු කම්කටොලු හමුවේ නොසැලී සිටින්නට අපට ශක්තිය ලැබේවා. ලංකාද්වීපයට යන්නට ධෛර්ය ලැබේවා."

"අප කෙසේ හෝ මේ කර්තව්‍යය ශ්‍රද්ධා සිතින් ඉටුකරමු හේමමාලා... ඔබත් සමඟ මම සිටින්නෙමි. ඔබව හැර නොයමි. "

"ස්වාමිනී මට ඔබව විශ්වාසයි "

මෙතෙක් හුන් දිරිමත් සවිමත් ස්ත්‍රී ප්‍රතිබිම්බය ලබැදි පෙම්වත් හඬකට ආරෝපණය වී දන්ත කුමරුන්ට පැවසූවේ ය. ශෘංගාරාත්මක නොවූ ප්‍රේමයේ අගට වන මෛත්‍රී වර්ණයක් දෑසේ දල්වාගත් හේමමාලාවන් මහත් සෙනෙහසක් ඔහුට දැක්වූවේ ඔහු දුටු දිනේ පටන් ය.  දන්ත කුමරුන්ද ස්වකීය පුරුෂ පෞරුෂය රණකාමී වූත් එඩිතර වූත් ජවය පසෙකින් ලා පෙම්වත් හදින් මෙත් සිත් දැහැනින් කුමරියගේ අතින් අල්ලාගත්තේ ය.

"මා දළදා වහන්සේත් නුඹවත් කෙසේ හෝ රැකගන්නවා"

කුමරුන් හිතින් සපථ කළේ ය. මුවින් නොකීවද එවදන් කුමරියගේ සිත කුමරුගේ නෙත් කැල්මෙන් කියවා

ගත්තී ය. කුමරියට ඒ සිත කියවන්නට වත් කුමරුට කුමරියගේ සිත කියවන්නටවත් වචන අවැසි වූ වේ නැත. ඈ කුමරු හොදින් හැඳින්නා ය. කුමරුද කුමරියව හැඳුනුවේ ය.

දන්ත කුමරුන් හමුවූ දිනය ඇයට එදා වාගේ මතකය.

ඒ දෑවුරුද්දකට පමණ මත්තෙන් වූ වසත් සමයේ පැහැබර සවසකි. මළ ඉර එලියෙන් විස්තුරු වූ පරිසරය නෙතු නිවාලන යාමයකි. කුමරිය සිටියේ සිය පිරිවරද සමඟින් නෙලුම් මල් නෙලමින් ය. හද්‍රා එපා එපා කිව්වත් කුමරිය තම අතින්ම නෙලුම් මල් නෙලන්නට විල් දියට බසින්නී ය. එදින එසේ ඒ නෙලූ නෙලුම්ද රැගෙන ඕ මාළිගයට යන්නට ගියා ය. පරිවාර කතුන්ද ඈ හා අල්ලාප සල්ලාපයේ යෙදෙමින් පැමිණියහ. හේමමාලා මේ මල් නෙලා යන්නේ දළඳා වහන්සේ දක්නටත් වදින්ටත් ය.

ලතාවකට මෙන් ඇගේ කඩාහල දිගු වරලස පා තබන රිද්මයට සෙලවෙයි. සලු පිලි ඈ ඇද සිටියේ ඉතා සරල වූත් ඉතා සංවර වූත් ඉතා සිත් තැන්පත් කරන්නා වූත් ආකාරයකටයි. ඇගේ ගෙලේ එක් මුතු හරකි. තවත් මරකත මාලයකි. තවත් රන් වැල් කිහිපයකි. කුණ්ඩලාභරණ දෙක දිගුවූ ස්වර්ණාභරණ විය. නළල් තලයේ තැල්ලක් රැදෙයි. හිසකේ අතරින් සුගන්ධවත්

පිච්ච මල් දාමයක් ගැවසී ඇත. දෑතෙහි රන් වළලුත් පයෙහි මිණි කිකිණිත් රැඳෙයි. හේමමාලා කුමරිය දක්නා ඇතැමුන් ඒ ස්වර්ණාභරණ පරදා උදුලන රූපශ්‍රීයෙන් මත්වෙයි. තවකෙක් ඒ රූපශ්‍රීය දෙස බලා සිත් නිවා ගනියි. තවත් අයෙක් ඒ රූප ස්වභාවය අභිමුව ස්ත්‍රී තේජසක් දැක බිම බලයි. ඇගේ ගමනේ උදාරත්වය කවරරෙකු බැලුවත් වෙනස් නොවේ. එහෙත් ඈ සිය රජ්‍යයේ සියල් මිනිසුන්ටත් සතුන්ටත් තුරුවැල්වලටත් ජීවයටත් ප්‍රේම කළා ය. අසරණ දිළින්දුන් සොයා බලා පිහිට වූවා ය. බල තණ්හාවෙන් අන්ධ නුවූවා ය.

මෙසේ සුන්දර හේමමාලා කුමරිය පැමිණි මග දිගෙහි විදුලි වේගෙන් අසස් රියක් පැමිණියේ ය. කුමරිය අසලටම විත් නැවතුනු අසරුවා කේන්තියෙන් මෙන් කුමරියට බැණ වැදුනි.

"මේ ළමිස්සියෝ ... උදේනි පුර රජුන්ගේ පුත්‍රයාගෙ රථයට නෙව හරස් වුනේ... අයින් වෙයව් "

කුමරිය මාර්ගයෙන් ඉවත් වූවේ නැත . ඈ මග සිටගෙනම අසරුවා නොතකා රථය ඇතුළ බැලුවා ය. කඩවසම් දන්ත කුමරු ඇය දුටුවේ එවිට ය.

"නුඹ වංශත් කුමරියක් නේද... මගේ අසරුවාගෙන් යමක් වූවානම් සමාවන්න කුමරිය "

"මා නම් වංශවත් වූවත් මාත් අසරුවා මෙන්ම මනුෂ්‍යයෙක් කුමරුනි... මා ඔහු වූවානම් මාත් මේ වදන්ම පවසාවි..."

"නුඹේ වචනවලින්නම් උගත් වියත් බවකුත් පෙනෙනවා කුමරියනි පවසන්න නුඹ කවුද යනවග... "

"මා ගුහසීව රජුගේ දියණියයි "

"අහෝ මේ සැබෑවක්ද? මා ගමන් ගන්නේත් නුඹ මාළිගයේ ඇති දළදාමාලිගාව වෙතයි... එන්න රිය වෙතට... මා සමඟම නුඹට යා හැකියි"

"එහෙත් කුමරුනේ මෙසේ යෑම සුදුසු නොවේ"

"නැත කුමරියනි ගමන් පහසුව සලසන්නයි මා සිතුවේ"

"නුඹට කාරුණික හදවතක් ඇති බව වැටගෙනවා එහෙත් කුමරුනි මා වැනි අවිවාහක ස්ත්‍රියකට මේ ගමන නුසුදුසුයි හැගේ... නුඹ යන්න ... මා පැමිනෙන්නම්..."

"නුඹ නිවැරදියි... "

"මේ මල් මිට රැගෙන යන්න"

කුමරිය දන්ත කුමරුන්ට සුදු නෙළුම් මිටක් දුන්නා ය. ඒ සුදෝ සුදු මල් මිට දෙසේ කුමරුත් ඕනෑකමින් බැලුවේ එය වෙනදාට වඩා සුගන්ධවත් වී ඇත්තේ ඇයි දැයි සිතමිනි .

"ස්තූතියි ... අපි යමු ..."

කුමරා පිටත්ව ගියේ ය. එදින පටන් මොවුන් දෙදෙනා වරින්වර හමුවූහ. එහෙත් කුමරිය සිත තිබුණු ප්‍රේමය එක වරම ඇය මව්පියන් ඉදිරියේ පවසා සිටියා ය. එසේ ආදරණීය බැඳීමක් මොවුන් දෙදෙනා අතරේ ගලාගියේ දෙමාපියන්ගෙ ආශිර්වාදය ද සමඟිනි.

කාලයාගේ ඇවෑමෙන් පෙම්වත් යුවල අඹුසැමි යුවලක් බවට පත්වී ලෞකික ජීවිතය සුවපහසු ලෙසත් ආධ්‍යාත්මය ධර්මයින් සරිකරගනිමිනුත් කාල ගංගාවේ ප්‍රේම යාත්‍රාවේ ගමන් ගත් හ. එහෙව් ආ සංසුන් ගමන තුළ බරක් වගවීමක් වගකීමක් කුමරාට දැනුණද කුමරිය සැහැල්ලු ගති පැවතුම් ඇත්තෙන් එම වගවීම හා වගකීම එතරම් බරක් පතළට නොතේරුණි. ඈට එය ප්‍රථම වරට හැඟී ගියේ දාතුන්වහන්සේ රැගෙන යන අවස්ථාවේ නොව උන්වහන්සේ රකින්නැයි සිතා ගිරෙන් පත්ලට පැනි අවස්ථාවේ ය. තමා කෙසේ එතරම් නිර්භය වීද කියා ඈට පුදුම සිතුණි. එහෙත් එය එසේ ය. දැන් හේමමාලාවන්ට වගවීම හා වගකීම කෙසේද යන්න

හුදෙක් සිතුවිල්ලක්ම නොව හදවතින් ආත්මයට ගිය මහා පවුරක් වැනි යුතුකමක් කියා හැගෙන්නේ ය.

මලය රජ තෙමේ ද ඔවුන් ලුහු බැඳීම නවතා තිබුණේ නැත. හෙතෙම ඔවුන් සිටිනා ගුහාවටද පැමිණීය. කුමරුත් කුමරියත් යළිත් දාතූන්වහන්සේ රක්නා පිණිස දිවි පරදුවට තබා දිවයන්නට විය. සතුරු සේනාවෝ රැසක් ඔවුන් වටලස් තිබුණි. අවි අමෝරාගෙන ඔවුන් පසුපස පන්නනා  සතුරන් හමුවේ පරාජිත බවක් දැණුනද කුමරිය සිතුවේම කෙසේ හෝ දාතුන්වහන්සේ රකින්නට අවශ්‍යයි කියායි . කුමරියත් කුමරුත් ඒ ගුහා දිරින් ගොස් පර්වත මුදුනකට නැගගත් හ. සතුරන්ට සොයාගත නොහැකි වනසේ ගල්කුලකට මුවා වූහ. ඒ ප්‍රයත්නය සාර්ථක නොවීය. කිනිස්සක් අත දරා පැමිණියේ මලය රජුය.

දෙවරක් නොසිතා කුමරිය කුමරු සමඟින් මෙවර ද පර්වත මුදුනින් පැන්නේ බුදු ගුණ සත්‍යයි කියා සපථ කරමිනි. ඈට ඉන් එහා යමක් සිතන්නටවත් වෙලා නොතිබ්බා ය. සතුරට ඇති බිය නොවේ එය. එය දළදා වහන්සේ රැකගන්නට ඇති වගකීමත් උන්වහන්සේට වන හානිය වැළැක්වීමට ඇති වගවීමත් ය. මෙවර ඒ පැනීම මහා ගැඹුරු ආගාධයකට වුවත් කුමරුන් හා කුමරිය වසාගත් දෑස් විවර කරනා විට සිටියේ අහසේ පාවෙමිනි. ඔවුන්ට දැනුනේ යමෙකු පිට තමා සිටිනා

බවයි. ඒ වෙන කවරෙකුත් නොව රන්වන් ගුරුලෙක් ය. රන්වන් ගුරුලා පියාසලන්නේ ආකාස ගංගාව දිගේ කෙම්බිමක් කරා ය. දැන් දැන් පින්න මහා ඕඝයක්ව වර්සාවක් වී කඩා හැලෙයි. ගුරුලා එය නොතකමින් ඉදිරියට ඇදුණෝ ය. වර්සාවෙන් කුමරුට හෝ කුමරියට විපතක් නොවුණි. එහෙත් තෙමෙමින් හා සිහිලසහි ගැසෙමින් ඔවුනොවුන් මදක් දුක්වුවද ඒ දුක සිතට කාවැදුණෝ නැත .

හෝරා දෙක තුනකට පසුව හේමමාලා කුමරිය හා දන්ත කුමරුන් දිගු පියෑසැරියක නිමාව දනවමින් නැවතුණෝ මුහුද අසබඩ භූමි භාගයක ය. ඔවුන දෙස බලා සිටි ගුරුලාගේ හිස අතගා කුමරිය ස්තූති කළා ය. ගුරුලා තුටු කදුලක් හෙලා නික්ම ගිය පසු ගිමන් මහන්සිය නිවාලනුවස් කුමරිය සලු පිලිද සකසමින් වැල්ලේම අසුන් ගත්තා ය. කුමරුද ඈ අසලින් අසුන් ගත්තේ ය.

"මා ප්‍රිය කුමරියනි නුඹට මහන්සිද"

"නැත කුමරුනි මට වෙහෙසක් ... මේ භාරදූර කාර්යය නිමාවනතෙක් මගෙ දෑසට සැනසීමක් කොහෙද ?"

"එය මා දනිමි හේමමාලා එහෙත් හදිසියේවත්"

"කිමද ස්වාමිනි"

"හදිසියේ හෝ මට අනතුරක් වුවහොත් "

"නුඹත් සැරසෙන්නේ මා පියාණන් සේ මා හැර යන්නද? "

"නැත නැත සන්සුන්වන්න මා පවසන්නේ කුමරියනි කුමක්වූවත් නුඹ කෙසේ හෝ දළදා වහන්සේ රැගෙන ලංකා ද්වීපයට යා යුතුයි "

"එහෙත් කුමරුනි"

"නැත එය කළ යුතුමයි "

කුමරුන් හුන් තැනින් නැගිට තමා අත වූ අවිය ද කරට ගත්තේ ය. කුමරිය ද ඔහුගේ අතින් අල්ලා නැගිට්ටා ය. දන්ත කුමරුන් අවට නිරීක්ෂිත දෑසින් විපරම් කළේ ය. ඒ පරිසරය නිහඬය. ගුප්ත බවක් රැඳී ඇත්තේ ය. හතරතින් වනාන්තරය ය. ඈතින් මොණරකුගේ කෑගැමත්, ඊටත් එපිටින් සුළගට ලෙළ දිදී ඉදිරියට එන ශාක පත්‍රවල හඬත් පමණක් ඒ පරිසරයේ නිහැඬියාව විටින් විටට බිදියි. කුමරියගේ සිතත් දුකින් ධෛර්යයටත් වීර්යයෙන් වීර්යටත් පෙරළෙයි. ඈ සිත දුකෙන් දුකට නොගිය ආලෝකයින් ආලෝකයට යන්නට තරම් ධර්මයෙන් මුහුකුරා තිබුණි.

"කුමරියනි , කුමරියනි අප දාතූන්වහන්සේ දැනට සඟවා

තැබුවොත් යහපතක් වේවි "

"මාත් එසේ සිතනවා කුමරුනේ එහෙත් කොහෙද සඟවන්නේ"

"මේ වැලි අතරේම සඟවා අහරක් සොයා යළි හැකි ඉක්මනින් පැමිණෙමු කුමරියනි "

"හොදමයි "

හේමමාලා කෙහෙ අතර සැඟවූ උතුම් දන්ත දාතුන්වහන්සේ ගෙන දන්ත කුමරුගේ දෑතින් තැබුවා ය. ආලෝක චක්‍රයක් එයින් නික්මී අතුරුදන් වීය. දන්ත කුමරු ප්‍රවේශමෙන් එය වැලි අතරේ තබා වැල්ලෙන් වැසීය.

යාබද වන පියස කරා ගමන් ගත් හේමමාලා කුමරියට කුසගින්නක් දැනුණි. මෙතුවක් නොදැනී එය තිබුණේ වගකීමක බර නිසාද එසේත් නැත්නම් සතුරාට තමා බියවූ නිසාදැයි ඈ සිතන්නී ය. එහෙත් සැබෑව නම් දළදාවහන්සේ රකිමින් ආ මේ ගමනේදී තමා සිත තිබුණේ උන්වහන්සගේ ආරක්ෂාව මිස වෙන දෙයක් නොවන නිසා ය.  ඒ තරම්ම ඇයට ඇගේ සීරුණ දෙපාවත් මඩ තැවරි රතුපුල් පතුල්වත් දූවිල්ලෙන් හා දාදියෙන් තෙත්ව ගිය මාලිගේදී සුවද සඳුන් ආලේපිත

සිරුරවත් තැකීමක් නොවූයේ දළදා වහන්සේ සිය දිවියටත් වඩා වටිනා අගනා දෙයක් වූ බැවිනි. සිය පියාණන්ගේ අවසන් ඉල්ලීම වූ දාතුන්වහන්සේ රැකගන්න කියා ඉල්ලීමත් මෑණියන්ගේ බලාපොරොත්තුව වූ දාතුන්වහන්සේ ගෙනයන්න කී ඉල්ලීමත් මතක් වීම ඈ සිත දිරිමත් කළා ය. ඉන් පළා යන්නැයි කීමට තරම්වත් ඒ සිතෙහි සිතලු අංශුමාත්‍රයකුදු නොවීය. බෞද්ධ ස්ත්‍රියකව දාතුන්වහන්සේ ඇල්ලීමට තහංචි ලූ සංස්කෘතිය පසෙක තබා ශ්‍රද්ධාවෙන් මනස්විල පුරවාගත් හේමමාලා සංස්කෘත බැම්ම බිදගෙන දිගු ගමනක් ඇවිල්ලා ය. ඉදින් ඈ නිර්භීත ය. වීරය. උත්සහවන්ත ය.

දහස් දෑ හිස තියෙද්දී ඈ දුටුවේ රත් කෙහෙල් ගහක ඇති කෙසෙල් කැනකි. ඉන් රත් කෙහෙල් ගෙඩි දෙක තුනක් ඔවුන්ට සෑහේ යැයි සිතා දන්ත කුමරුට එය පෙන්වී ය. කුමරුත් කුසගින්නේ ඇගේ ගමනට සහය දුන්නෙන් කුමරු සොය දුක් ගැහැට නොතැකුවේ ය. ඔහුට අවැසි වූවේ දාතුන්වහන්සේ ආරක්ෂා කිරීම පමණක් නොවේ හේමමාලාවන් ද රැක ගැනීමටයි. කෙහෙල් ගෙඩි දෙක තුනක් හනි හනික කා දමා යළි යන්නට සැරසුණු කුමරාත් කුමරියත් නැගිට ගත් හ. ඒත් එවෙලේ රහතන් වහන්සේ නමක් සෘද්ධි බලයින් පැමිණියේ ය.

"කුමරුනි කුමරියනි ගමන ඉක්මන් කළොත් යහපත්."

රහතන්වහන්සේ පැවසූ සේක.

"එසේය ස්වාමීන් වහන්ස"

ඔවුහු දණනමා උන්වහන්සේට නමස්කාර කළහ.

"තෙරුවන් සරණයි . අනතුරක් වුවහොත් මා සිහි කරන්න. මා නුඹලාට උපකාර කරන්නම්. මේ ගමනේ කුමක්වූවත් නුඹලාගේ ගමන සාර්ථක වේවි. "

එසැනින්ම ඒ සඟරුව නොපෙනී ගියේ ය. කුමරුද කුමරිය කැටුව ඉක්මනින්ම පැමිණියේ දළඳා වහන්සේ රැගෙන පිටත්වීමට ය. එහෙත් එතැන වැලි ඇවිස්සී තිබුණා විනා දාතූන්වහන්සේ නොතිබිණි . හේමමාලා වැලි අවිස්සා විපරම් කළා ය. එහෙත් නැත. ඕ හඬ නගා හැඬුවා ය . දන්ත කුමරු වටපිටාව විපරම් කළේ ය. එහෙත් කිසිවක් තිබුණේ නැත. කුමරිය යළි යළිත් පොලොවේ හැපි හැපී හඬා වැටුණා ය.

"අහෝ දළඳා වහන්ස මෙසේ නුඹ වහන්සෙ තබා ගියාට සමාවන්න... මට සමාවන්න දළදාවහන්ස... අහෝ මා කළ දේ ... මට සමාවන්න ... "

"නැත කුමරියනී මායි පැවසූවේ ... මට සමාවන්න දළදාවහන්ස... "

පොළොවේ හැපී හඬනා මොවුන්ව දුටු පෙර පැමිණි රහතන් වහන්සේ සැබැවින්ම දළදාවහන්සේ ඇත්තේ කොහේදැයි විමසන විට එය නා ලොව රජු අසළ ඇති බැව් සොයා ගත් සේක. රහතන්වහන්සේ නා ලොවට ගොස් නා රජුන් හමුව ...

"රජුනි මෙය අයත් මෙරටට නොව , ලංකා ද්වීපයටයි . එහි වැසියන් බොහෝ කාලයක් සතවස් ගණනාවක් දළදාවහන්සේට පූජෝපහාර අනාගතයේදී පවත්වාවි. මට රැගෙන යන්න අවසරයි."
 යැයි වදාරා නාලොව රජුගේ අවසර ඇතිව යළිත් ගෙන ආ සේක. ගෙනැවිත් හේමමාලාවන්ටම යළිත් භාර කළ සේක.

"නුඹ දිරිමත් ස්ත්‍රියක්. එහෙත් විමසිල්ලෙන් සිටින්න. නුඹේ විමසිලිමත් බව මේ ගමනට උපකාරියි. එහෙත් මතුයම් දිනක නුඹගෙ උදාරත්වය මිනිසුන් මුව මුව රැදේවි. දැන්ම ගමන ආරම්භ කරන්න "

රහතන්වහන්සේ එසේ පවසා සෘද්ධි බලයින් අහසට වැඩිසේක. උන්වහන්සේ අහස් කුස තුළ වලාවන් අතරේ නොපෙනී යනයුරු කුමරුත් කුමරියත් බලා සිටියහ. ඉන්පසු තප්පර මාත්‍රාවක්වත් පමා නොවී ඔවුන් යළි ගමන ඇරඹූහ.

දුරු කතර ගෙවාගෙන ඇවිද ගියහ. කුමරියගේ දෙපා සීරී තුවල් තිබුණද ඕ එය නොතැකුවා ය. කුමරු ඈ හට සෙවණ වී මුතු කුඩයද ඉහලා ගෙන ඈ පසුපස පැමිණියේය . හෝරා වරු බවට පත්ව අන්ධකාරයේ කිමිදෙමින් ආලෝකයේ නැහැවෙමින් වැලි දිගේ පැමිණෙමින් විත් මුහුදු දිය සොයා ගත් කුමරුත් කුමරියත් රුවලක් හෝ යාත්‍රාවක් තිබේදැයි සෙවීය. නීල දියඹෙහි එහෙත් කුඩා රුවලක් යන්නට සැරසී තිබුණි. ඔවුන් වහ වහා ඒ දෙසට දිව ගියහ.

"නුඹලා කොහේද යන්නේ "
කුමරු හතිලමින් ඇසුවේ ය.

මිත්‍ර ලීලාවෙන් සිනාසුන් නැවියා බාලා සිටියේ ය. ඔහු මුතු හරවල් කිහිපයක් පැළඳ දඹදිව මිනිසුන්ගේ සුපුරුදු වස්ත්‍රාභරණයෙන් සැරසී හුන්නේ ය.

"අප යන්නේ සිහල දේසෙට නොවැ"

"අප.. අපවත් රැගෙන යා මැනව "
හේමමාලා කුමරිය වෙහස පසෙක තබා ආයාචනා කළා ය.

"නුඹලා ගොඩවන්න එහෙනම් "

"අහෝ කුමරුනි ! මලය රජු"
කුමරිය මහ හඬින් කෑ ගැසුවේ බියට තැතිගෙනය. දැන් දැන් සේනාවක් පෙර නුවූ මහා යුද සේනාවක් ඔවුන් වෙත එමින් සිටියහ.

"සේනාවත් ඇවිත්, ඉක්මන් කරනු "
දන්ත කුමරු රුවලෙහි වූ පිරිසට අණකළේ ය. වාසනාවකට දෝ නැවියාත් අතුරු පිරිසත් ඔහුගේ හඬට නැමුණෝ ය.  සියල්ලෝම රුවල මුහුදට දියත් කළහ. ඉතා ඉක්මනින් එය මුහුදට යාත්‍රාවිය. මලය රජු දිය ඔස්සේ පීනන්නට තැත් කළේ ය. ඉදුනිල් කැට දිය දහරාව මැද්දෙන් වියරු වෙසින් හෙතෙම පැමිණියේ ය. එහෙත් ඔහු තැත් කළත් මද දුරකදී කිමිදී ගොස් ජලයේම ගිලී ගියේ ය.

"නුඹලා ඇයි සිහල දේසෙට යන්නේ"

රුවලේ ප්‍රධානියා යැයි කිව හැකි වෙළෙන්ද නැවියා විමසුවේ ය .

"අප ගෞතම බුදුන්ගේ වාම දන්ත දාතූන්වහන්සේ රැගෙනයි යන්නේ සිහල දේසෙ රජුට භාර කරන්න "

"මොනවා ... අප රජුට ... අහෝ ජය ශ්‍රී ජය ශ්‍රී කවර ප්‍රීතියක්ද ඒ උතුම් බුදුරජාණන් වහන්සේගේ

ධාතුන්වහන්සේ නමක් ලංකාදීපයට වැඩීම... සාදු සාදු සාදු... එහෙත් නුඹලා කවුදැයි කීවේ නැහැනෙව"

"මා හේමමාලා කුමරිය "

"මම සිතුවා හරි එසේනම් මේ දන්ත කුමරු "

"එසේය මිත්‍රය "

"කෙසේ වූවත් ලංකා රාජ්‍යයෙ රජුන් හමුවන්නට පහසුයි, කිසිවකටත් බිය වන්නෙපා මෙරටත් නුඹේ රටම වාගේ දැනේවි "

කාලය කෙමෙන් කෙමෙන් ගෙවී ගියේ ය. වටපිටාව අඳුරෙහි ගිලෙමින් රාත්‍රිය උදාවීය. දන්ත කුමරුගේ අසළ සිටි හේමමාලා කුමරිය මද නින්දකට පත්වීය. ඉන්පසුව දන්ත කුමරුද නින්දට වැටුණි. රුවල ගමන් ගත්තේ රාත්‍රී අඳුර මැද ලන්තෑරුම් එලියකිනි. කිසිවක් හරියාකාරව පෙනුණේ නැත. හේමමාලා කුමරිය අඩ නින්දේ සිටියත් ඇගේ නළලත දෙසට කුමක් හෝ ඇදී එනු දැනුණි. ඈ නින්ද්‍රාවෙන් උන්නද ඇගේ අවඥාණය තුළ ඇති සවිඥණික විමසිල්ල ඈව ආරක්ෂා කරන්නී ය. කුමරිය ක්ෂණයෙන් දෑස් විවර කළා ය.

ඈ දෙස පෙනය පුප්පා මුහුණට මුහුණලා බලා හුන්නේ

කලු පැහැ නාග රාජයකි. හේමමාලාවන්ට කළ හැකි යමක් නොවීය. දන්ත කුමරුගේ උරහිසෙන් තදව අල්ලා ගත්තා ය. නින්දට පත් දන්ත කුමරු ද අවදිවී ය. හේමමාලාවන් පසුපස හැරුණි. තවත් ඒ සා විශාල නාගයින් තිදෙනෙක් ය. ඈ සිත ශක්තිමත් කරගත්තා ය . ඇස් පියා ගත්තා ය. වැදගත්තා ය.

"උතුම් බුද්ධ රත්නයේ ගුණ සත්‍යයි . බුදු රජාණන් වහන්සේගේ දන්ත ධාතූන්වහන්සේගේ ගුණ සත්‍යයි. අසූ කෙලක් ධර්මස්කන්ධය ස්පර්ශ කළා වූ දළදාවේ සත්‍යානුභාව බලයේ ආනුභාවෙන් කිසිදු විපතක් නොවේවා. අපට කිසිදු හානියක් නොවේවා. අප ආරක්ෂා වේවා. "

හේමමාලා කුමරිය සත්‍යක්‍රියා කළා ය. එකී සත්‍යක්‍රියාවෙන් සයුරෙන් මතුව ආ නාගයින් නොපෙනී ගියහ. ඒ වෙනුවට එම අහසින් එහෙම මොහොතේම මල් වැස්සක් වැටුණි.

"සාදූ සාදූ සාදු..."
රුවලේ වූ පිරිසගේ මුව මත රැදුනි.

රුවලේ වූ මිනිස් සමූහයේ උපකාරද ඇතිව හේමමාලා කුමරිය හා දන්ත කුමරු ලංකාද්වීපයට පැමිණියහ. හේමමාලා කුමරිය හා දන්ත කුමරු යන මග දිගට සුදු

නෙලුම් මල් ඇතිරී මඟක් ඉතාම ලංකෘතව නිමවී තිබුනේ ය. ඒ නෙලුම් මල් මතින් පා තබා කුමරියත් කුමරුත් ඉදිරියට ගියහ. කුමරු මුතුකුඩය ඉහලා කුමරියය සෙවණ සැලසීය. නැව්යා පැවසූව සත්‍ය කරමින් මේ ද්වීපයද ජම්බුද්වීපය ලෙසම කුමරියට හැඟී ගියා ය. මේ මගේ රට කියා ඈ සිත කියන්නට විය. ලංකා භූමිය ස්පර්ශය පවා සනීපදායක බව දැනුනි. ඒ සාක් ප්‍රේමයක් දේශානුරාවක් නගන්නට සුලු මොහොතක් මේ පුණ්‍යභූමියේ වායු තලය මත ඇත. ලංකා භූමියේ වන එකී නැවුම් ප්‍රබෝධමත් සැනසිල්ල කුමරියගේ වෙහෙස නිවා සිත සනසන්නට විය. කුමරුටද එය මහත් සැනසීමක් විය.

කුමරුත් කුමරියත් නෙලුම් මල් ඇතිරි මාවතේ කෙලවර සේ දුටුවේ බ්‍රාහ්මණ අසපුවකි. එම අසපුවට ගොඩවෙත්ම බ්‍රාහ්මණයෙක් යැයි කිය හැකි මිනිසෙක් දුටුවේ ය. ඔහු සුදුවතින් සැරසී නවගුණ වැලක් අතක දරා බිම බලා එදෙසට ආවේ ය. හෙතෙම පැමිණ ඔවුන් හමුවේ කතා කරන්නට පටන් ගත්තේ ය.

"නුඹලා කවරෙක්ද "
නිවුණ ස්වරයෙන් දෑස් නොහැරම කතා කළේ ය.

"මම කලිඟු දේශයේ ගුහසීව රජුගේ දියණියයි මේ මාගේ ස්වාමී වූ උදේනි රජුගේ පුත්‍ර දන්ත කුමරුයි"

"කුමරියනි, නුඹ කිමද ලංකාද්වීපයට පැමිණියේ "

"බමුණ මාගේ පියාණන් දුන් යමක් මා හට ලංකාද්වීපයේ මහසේනා රජුන්ට දීමට අවැසියි" කුමරිය දන්ත දාතූන්වහන්සේගේ ආරක්ෂාව පිණිස එසේ පැවසුවා ය.

"හොදමයි එහෙත් මහාසේනා රජු මීට පොහොය හතකට පෙර මියගියා "

"එසේනම් අප කුමක්ද කරන්නේ"
ඈ විමසුවේ ශෝකයෙනි.

"නැත කුමරියනි, මහාසේනා රජුගේ පුත්‍රයායි දැන් රජුව සිටින්නේ. අද මෙහි නැවතී ගිමන් නිවාගන්න හෙටම අනුරාධපුරයේ මහ වාසලට අප පිටත් වෙමු"

"නුඹට බොහොම ස්තූතියි බමුණ"

හේමමාලා කුමරියත් දන්ත කුමරුත් පසුදින උදාවන තෙක් එහි නවාතැන් ගත් හ. ගල් ලෙන් කුටොය ඔවුන්ට වෙන් කර දුන්නේ බමුණා විසිනි. ඊට මෑතින් ගලා යන නීල වර්ණ දිය නදිය සිත් කලුය. කුමරුත් කුමරියත් දියට බැස ඇති ලෙස සිරුර නහවා ගත්හ. සවස් වන තෙක් ධාතූන්වහන්සේ කුටියේ ගල් පතුරක් තුළ සඟවා

තබා තිබීමෙන් ඊට හානියක් නොවීය. දිය නහා පැමිණි ඔවුන් දෙදෙනාට ධාතූන්වහන්සේ තිබුණු තැනම තිබීම දැකීම මහත් සැනසිල්ලක් විය. කුමරියට දැනුණේ මේ රටේ මිනිසුන් පමණක් නොවේ සතා සිව්පාවත් පන්සිලෙහි සරනා සැබෑ ශ්‍රද්ධාවන්තයින් බවය.

රිවි අවරඹරේ ගිලෙමින් රාත්‍රිය උදා විය. හේමමාලා කුමරිය රිසි සේ නොනිදා පහන් කරන අන්තිම රාත්‍රිය මෙය වේවා යැයි සිතා දෑස් මදකටවත් නොපියා සිටින්නී ය. පහන් ආලෝකයින් මේ සත් දිනට වියැකී වියපත් වූ ඇගෙ අවපැහැ මුව දෙස දන්ත කුමරු බලා සිටියේ ය. ඔහුත් ඇස් පියවුණාත් නොනිදන්නෙකි. කුමරු සිතුවේ මෙවන් දිරි ඇති ගැහැනියක් කියා ය. ඔහුට සියුම් ආඩම්බරයකුත් කුමරියගේ වෙහෙස පිළිබඳව ශෝකයකුත් පිරී ගියේ ය. කුමරියද දෑස පහන් තිරයින් මෙපිටට ගෙන කුමරුගේ දෑස් අසල නතර වූවා ය. නේත්‍රා නේත්‍රා තුළින් ගොස් මනස්චිත බසකින් ඔවුනොවුන් සිය සිය සන්තාන වෙත කතා කරන්නට පටන් ගත් හ.

නොනිදා පහන් වන බව නොදැනුනි. සන්තුෂ්ටිය හද සැරසූ කුමරිය ඉක්මනින් ගමනට ලෑස්ති වූවා ය. පඩු හා සුදු වස්ත්‍රයින් සැරසී මුතු කුඩය යටින් කුමරිය රැගෙන කුමරු කුටියෙන් පිටට පැමිණියේ ය.

එළැඹෙන එම දිනය වූවේ මෙකී මහා කර්තව්‍යයේ අවසන සනිටුහන් කිරීමයි. ඉන් පසු කුමරියත් කුමරුත් මහවාසල කරා ගව් ගණනක් ගෙවමින් බමුණා සමඟ නික්ම ගියහ.

ගමන අතරතුරේදි කුමරිය බමුණන් හමුවේ තබා සැබෑවටම මෙහි පැමිණි කාරණය දන්වා සිටියා ය. හෙළි කිරීමට ඇය අකමැති වූවේ දාතූන්වහන්සේට අනතුරක් වේ යැයි හැඟී ගිය හෙයිනි. එය දැනගත් වහාම කුමරියගේ දෙපා අභියසහි වැද වැටුණු බමුණා තුටු කඳුලු සැලීය.

"අහෝ තිලෝනායක සම්මා සම්බුදු පියාණන්ගේ ශ්‍රී ධාතූන් වහන්ස දක්නට රක්නට මාත් පිං කර තිබූ සැටි දෙවියනේ තව කල්පයක් පරයා මේ බුද්ධ රශ්මි මාලා විහිදෙත්වා !"

අනුරාධපුර මාලිගය සුවිසල් එකක් වීය. එහි තේජස ඔප් කරන්නේ කැටයම් හා කලා නිර්මාණය. ලීයෙන් රිදියෙන් ලෝහෙන් රණින් නිමවා ඇති මනස්කාන්ත දර්ශනීය මාළිගා ගෘහ නිර්මාණ ශිල්පය දක්න දක්නා අයගේ නෙත් සිත් පිනවයි. අභ්‍යන්තරයේ සභාගර්භය තුළ රාජ සිංහාසනය මස්තකයේ රජතුමා හිඳ සිටියේ ය. වාසලහි උන් පිරිස නොතකා එහි ගිය කුමරිය පැමිණි පුවත බමුණා හෙළිදරව් කළේ ය.

"මහා රාජෝත්තමයාණන් වහන්ස, මේ කුමරුන් හා කුමරියන් පැමිණ ඇත්තේ අප තථාගතයාණන් වහන්සේගේ වාම දන්ත දාතුව රැගෙනයි... ඒ උතුම් දළදා වහන්සේගේ භාරකාරත්වය අද පටන් ඔබ සතුයි දේවයාණන් වහන්ස... ඔබ වහන්සේ මේ දළඳා දාතුව රැක ගනිමින් තව තවත් චිරත් කාලයක් බුද්ධාලෝකයින් ලංකාද්වීපය බබලවන සේක්වා !"

රජවාසලේ රජුන් හමුව ඔවුන් පැවසී දෙය අදහා ගත නොහැකි වූ රජතුමා සංඝරත්නය වහා රැස් කළේ ය. එතුමාගේ සිත මහා සතුටකින් ඉතිර යමින් තිබුණි. රජුන් මාළිගාව තුළම දාතූන්වහන්සේ උදෙසා එ ක්ෂණයේ ම අස්නක් පිළියෙළ කළේ ය. නෙලුම් මල් ඇතිරූ එම කුඩා මල් අස්නක් මත රණින් කළ කරඬුවක දාතූන්වහන්සේ ගෙන නිදන් කළා වූ හේමමාලා කුමරිය සාදුකාර දුන්නා ය. ඇගේ සිත සිය අභිප්‍රාය ඉටුවීමෙන් අපරිමිත සතුටකටත් මහා සැනසීමකටත් පත්වූවේ දැන් ය. මේ මොහොතේ ඇගේ මහා කැපවීම උර දරාගෙන ආ වගකීම මනාව සම්පූර්ණ වීය. ඉන් මහත් ආනන්දයක් ඈ ලැබුවා ය. දන්ත කුමරුත් සාධුකාර දෙමින් මේ කර්තව්‍යයේ අවසානය මජත් ශ්‍රද්ධාවකින් සිදු කළේ ය.

"එහෙත් කුමරියනි මේ සැබෑම දළදාවහන්සේ ද ?"
එකවරම රජුගේ හිතේ කුකුසක් නැගිණ.

"එසේය රජතුමනි එසේය "
දන්ත කුමරු සපථ කළේ ය.

"මා කෙසේද විස්වාස කරන්නේ , සැබෑ දාතුවෙන් ආලෝක රශ්මි විහිදන බවයි මා අසා ඇත්තේ "

රජුගේ වදන් සත්‍යය. දාතූන් වහන්සේ විටක රශ්මි දහරාවක් මුදා හරියි. එය රජුට පෙන්විය යුතුයි කුමරිය සිතුවා ය. එහෙයින් කුමරිය සත්‍ය ක්‍රියා කළා ය. ඇගේ සත්‍ය ක්‍රියාවේ බලයින් දාතූන්වහන්සේ තුළින් ආලෝක ධාරාවක් නිකුත් වූවේ පිටත ඒකාලෝක කරමිනි. ජම්බුද්වීපයෙහි මෙතෙක් කල් නොපෙනුනු එම අලෝක කදම්බය ලංකාද්වීපයේ සතර කොණ එකලු කරමින් නික්ම ගියේ මෙහි ජීවත්වුණු සකල බෞද්ධයන්ගේ පවිත්‍රවත් ශ්‍රද්ධාව නිසාමය. රජුන්ද දොහොත් මුදුන් තියා ඒ ආලෝකයින් නිවී ගිය සිත් ඇතිව විචිකිච්ඡාව පසෙකලා දණින් වැද වැටුණෝ ය.

එතැන් පටන් අද දක්වා දළදාවහන්සේ පූජෝපහාරයන් මධ්‍යයේ සුරක්ෂිතව වන්දනාමානයට පාත්‍ර වෙයි. මෙහි හිමිකම රජයෙහි නායකයානන් විසින් දරන්නේ ය. රාජ්‍ය නායකයාට පැවරෙන්නේ ය. දළදා වහන්සේ තවත් බොහෝ කාලයක් දේව මානව පුද සත්කාර මධ්‍යයේ වසර ගණනාවක් මෙසිරිලක වැජඹේවා!
සියලු උපද්‍රවයන්ගෙන් ආරක්ෂා වේවා!

# හේමමාලා වරුණ

සිකිපිල් වරල ලිහා මදාරා මල් ගැවසූ කොමලී
රතුපුල් පාද නිසා දෝලාවෙන් ගියවූ කුමරී
නිලුපුල් දෙනෙත සලා කඳුලක් නොහෙළූ දිරිලී
වතපුල් පැහැනද මල හේමමාලා නම් කුමරී

ග්‍රුම් නද දුන් මල් තුරේ මල් ගී කියන්නී
මින් නද දුන් සලඹේ මුතු සැලෙන්නී
නෘත් නද දුන් රගේ නෘත් රග රගන්නී
සිත් බඳ සිත් තුරේ දන් මන නිවන්නී

බඳ වට රන් ලිය ලියවැල් එතීලා
රද සවනන් අග අගමල් වෙලීලා
පද සිට ඉස හිස මුතුවැල් දරාලා
නද වට පිරි පිරි සෙනගක් සනාලා

කෝමල රේඛා ඇඳි වුවනත පරසතු පරදා
මෝහන විදා විදි මනසත රුවසතු අගනා
සෝබන නිගා බිදි තෙජහස ලලනවු අගනා
ඕ හද පුදා හිදි කුමරුන දන්න වූ යුව නිරිඳා

දෙනුවර බන්දවා තොරණ් මංගල තුලාවේ
මෙනුවර පරදවා කුමරිගෙ රෑසිරි ශ්‍රියාවේ
ඒනුවර සරසවා කුසුමෙන් රන් රිදි ගලාවේ
ඒනුවර බබලවා මංගල කිණි සැලුණා වේ

සරනා විටක පෙම් බස් අතරින් දිවියේ
කරනා පිනක මහිමෙන් දෙදෙනම සැදෑහේ
ඒනෙනා යුදෙක රුහිරෙන් තෙත් වෙලාවේ
ඒවරා සැනෙක කගපත පිය පණ නැසුණාවේ

දේවිට කරන්නට යමකුත් නො තේරුණු
කුමරිට අඩන්නට වෙලාව මදිව හැඬූ
කුමරිම අරන් දළදා දා වගව යුතු
කුමරුට දිරිය දී පළාවේ දිවි නොතැකූ

මධුර සුවද කුංකුම නැති රනබරණාත් පසෙකට
කොදුර කොදුර මංවත් නැති ගිරිහෙල්වල උසකට
මතුර බුද්ධ නාමය ඇති පිරිතක් විය සවියක් කොට
ඉතිර ගියෙති සද්ධා සිත කුමර කුමරි දෙසිතේ ඒවිට

රතුපුල් පා සීරී ලේ වැගිරී රිදුමන් දෙන්නේ
නිලුපුල් දෙනෙතින් නම් නෑ කදුලක් වැගිරෙන්නේ
සිකිපිල් වරලේ සගවාගෙන දාතුන් ලක ගෙනියන්නේ
වතපුල් පැහැ මැකී ගියත් දිරිමත්කම සරසන්නේ

එයි එයි යන මග බාධා නිමාවක්ම නෑ එහි වෙන
දෙයි දෙයි ගස්වැල් නම් සෙවණක් නිලොහව වෙත
යයි යයි ඉදිරියටම කුමරිය මුහුදු දියෙන් එතර වන්න
වෙයි වෙයි සත්‍යක්‍රියාව අවංක හදවතට නැගෙන

සේනා පිටින් කගපත් ගෙන පෙරට ඇදී
මෝරා අසිපතින් නිරිදුගෙ ගෙලින් සිදී
පීරා නුවර දළදාවම සොයා යතී
සූරා මාලිගාවම වෙහෙසව සොයතී

නැග සයුරට රළ පහරට නැව යන්නේ ලක්පුර
මැඩ දුක්සිත ලතැවුල් සිය කුමරී යයි ලක්පුර
වැඩ සදැසිත නැත වන්නේ බිය සංකා සිත්පුර
සැඩ සුළඟත් පරයයී ඒ දිරිමත් කතගේ නෙත්මුව

රකුසු සොළොස් අත් විහිදති කුමරි නැතැයි හඩන්නේ
බකුසු රෑක බිය වද්දති සිත ඇගෙ නිති පිරෙන්නේ
ගුහසු මුලුව ගිමන් හරින කාලය නැහැ රැදෙව්වේ
කුමරු රකින කුමරි සෙනෙහස අමතක කරන්නේ

චිත්ත ඒකග්‍රතාව ඕ අරමුණකට දවටලා
මිත්ත පවුරු නැතත් තනිව වීරිය එහි මවාලා
බුද්ධ ශස්න රක්නට ඕ ගව් ගණනක් ඇවිද්දා
හේම මාලා පසු නොබැස්සෙ කදුළුත් විසිකරාලා

දරණ වෙහෙස නොතකා එඩි බල රන්දා දැසේ
කරන ශ්‍රද්ධ ශීලය එහි නොකඩව බන්දා ලාසේ
පෙරන සෙයට කුසලයමයි සිතට වද්දා බෝසේ
පොරණ මැණික් රැස් විහිදේ ඇගෙ ගුණ කද බෝසේ

හේමමාලා කුමරිය අදිටන් බෙල පෙන්වා
හේමමාලා කුමරිය ලක්දිවටම ආ දා
නේක'ලෝක රැස් දහරා කාගෙත් සිත් නිව්වා
හේමමාලා කුමරිය පින් රැස්කර කර සිටියා

ඇගේ කුළුණු හසරැල්ලෙන් අදිටන දිනු දා
ඇගේ කිරුළු දාතුව ගෙන පුදසත්කා කෙරුණා
ඇගේ මියුරු පදවැල්වල බුදුගුණ ගී වැයුණා
ඇගේ පසිදු වීර ක්‍රියා ලෝ කතුන් නොමද නිව්වා

ලොව ගැහැණුන් හිමි දිරිවත ඇගෙ සිත්වත ඔපලා
මුව කමලින් තේජ රශ්මි වෙත මන්දාකිනි පෙන්වා
දව රත්‍රං මාල නැතත් රජවන සැටි දක්වා
බව චක්‍රයෙ නිමාව වෙත ස්ත්‍රී සිත් නැමුවා

රුදු මනුසත දුර්ගුණ රැස දළදා රැස් මැකුවා
ලදු බොදුසිත ධර්මය තුළ මාලාවෝ හික්මා
විදු කිරණව අකුසල්මය මනු සිතින් ඈත් කරවා
සිදු පරයන කිතුමිණි නද ඇගෙ නාමින් නැගුණා

ඉදින් ඕ ලොව රණින් බබලන
ඉතිහාසයේ රන් සළකුණු තැබුවා වූ දිරි ලියකි.
මුදු හදින් කරුණා ඇසින්
ඕ දන්ත ධාතූන් වහන්සේ රැක්කා ය.
සකලවිධ ස්ත්‍රී රත්නයන් උදෙසා
ආදර්ශයක් වූවා ය.
ඕ , හේමමාලාවන් ය.

මේ තරම් දුරක් ඈගේ ගමනේ කියවූම
සමඟ පැමිණි ඔබට,

'දළඳා සමිඳු පිහිටයි!'

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්යය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)